# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1715/32 - 2011 ජූලි 22 වැනි සිකුරාදා - 2011.07.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 24අ වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2011 ජූනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2011 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිඝණක අධ්‍යයනායතනය (සංශෝධන) නියමාවලිය ලෙස හඳුන්වනු ලැබේ.

2. 2002 නොවැම්බර් මස 15 වැනි දින අංක 1262/32 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද කොළඹ විශ්වවිද්‍යාලයීය පරිඝණක අධ්‍යයනායතනය නියමාවලියේ 18 වැනි ඡේදයේ (1) වැනි උපඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන් එම නියමාවලිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(1) පහත සඳහන් විෂයයන් සඳහා මධ්‍යස්ථාන පිහිටුවනු ලැබිය යුතු ය :-

(අ) උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය ;
(ආ) ඉලෙක්ට්‍රොනික - ඉගෙනුම ;
(ඇ) බාහිර උපාධි ;
(ඈ) පරිඝණක සේවා ;
(ඉ) වෘත්තිය සංවර්ධනය ; සහ
(ඊ) ඩිජිටල් ව්‍යවහාර තාක්ෂණ මධ්‍යස්ථානය.".

08-214/1

1A - G 14826— 630 (2011/07)

එල්. ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 71 වැනි වගන්තියේ (2) (iii) වැනි උපවගන්තිය යටතේ විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලැබූ 1979 නොවැම්බර් මස 21 වැනි දින අංක 63/8 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1979 අංක 6 දරන පත් කිරීම් (උසස් කිරීම්) නියමාවලිය, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2011 ජූලි මස 01 වැනි දින,
කොළඹ දී ය.

08-214/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.